# ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි කර්මාන්තවල දයකත්වය : පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින්

**එච්. පී. ජී. එච්. වීරසිංහ සහ ඊ. එම්. ටී. කේ. සෙනෙවිරත්න**
**සමාජීය විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**
*gayaweerasingha@gmail.com*

ප්‍රාදේශීය සංවර්ධනය යන්න බහුමානීය සංකල්පයකි. යම්කිසි භූගෝලීය ඒකකයක් තුළ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික වශයෙන් සිදුවන වර්ධනය ප්‍රාදේශීය සංවර්ධනය වශයෙන් සරලව අර්ථ දැක්විය හැකිය. කර්මාන්ත ස්ථාන ගත වීමත් සමඟ පොල්හගවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සංවර්ධනය සිදු වී තිබෙන්නේ ද යන්න විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි කර්මාන්ත දායකවීම කෙතෙක් දුරට බලපානවාද, ප්‍රාදේශීයව කර්මාන්ත ස්ථාන ගත වීම ආර්ථික ක්ෂේත්‍රයට වන දයකත්වය සහ ප්‍රදේශයේ ජන ජීවිතයට වන දයකත්වය සහ බලපෑම සොයා බැලීම, අධ්‍යයනයේ අනෙක් අරමුණු වේ. $H_1$ ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි කර්මාන්ත දයක වේ සහ $H_0$ ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි කර්මාන්ත දයක නොවේ යන්න අධ්‍යයනයේ උපකල්පනයන් වේ.

අධ්‍යයනයේ දී සසම්භාවී පොකුරු නියදි ක්‍රමය යටතේ ග්‍රාම නිළධාරී වසම් 05 ක පවුල් 100 ක් නියදිය ලෙස තෝරා ගත් අතර සරල නිරීක්ෂණය, ප්‍රශ්නමාලා ක්‍රමය හා සම්මුඛ සාකච්ජා භාවිතා කරමින් දත්ත රැස් කර ගන්නා ලදී. පර්යේෂණයේ දී දත්ත සැකසීම හා දත්ත ඉදිරිපත් කිරීම සඳහා *SPSS 11.0 " EXCEL 2007* සහ *Arc GIS 9.2* පරිගණක මෘදුකාංග යොදා ගත් අතර කයි වර්ග පරීක්ෂාව භාවිතයෙන් දත්ත විශ්ලේෂණය සිදුකෙරිණි.

අධ්‍යයන සොයා ගැනීම් වලට අනුව ප්‍රාදේශීයව කර්මාන්තයන් ස්ථාන ගත වීම ප්‍රදේශයේ සංවර්ධනය කෙරෙහි බලපාන බව පැහැදිලි වේ. ඒ අනුව $H_1$ ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි කර්මාන්ත දයක වේ යන්න පිළිගැනීමට පුළුවන. එය මිනිසාගේ මෙන්ම ප්‍රදේශයේ දියුණුවට දායක වේ. මෙහිදී රැකියා ජනනය වීම පුද්ගල සංවර්ධනයට සෘජු දායකත්වයක් සපයනු ලැබේ. , සෘජු ලෙසම කර්මාන්නයන් ස්ථාන ගත වීම ප්‍රාදේශීය සංවර්ධනයට දායක වුවත් හුදෙක්ම ආර්ථික ක්ෂේත්‍රයට දායක වන බව පැහැදිලි වේ. ප්‍රාදේශීයව කර්මාන්ත ස්ථාන ගත වීම හේතුවෙන් ප්‍රදේශයක් මුහුණපානු ලබන ගැටලු අවම කර ගැනීමට හැකිවීමත් ආදායම් බෙදී යාමේ විෂමතා අවම වී ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය උසස් වීම මෙන්ම ප්‍රදේශයන් සංවර්ධනයට දායක කර ගැනීමට පුළුවන. මෙලෙස කර්මාන්තයන් හර ප්‍රදේශවලින් බැහැරව පර්යන්ත ප්‍රදේශයන් කේන්ද්‍ර කොට වැඩි වශයෙන් ස්ථාපනය කිරීමෙන් ප්‍රාදේශීය වශයෙන් පවතින සංවර්ධන විෂමතාවය අවම කර ගත හැකි වේ.

***ප්‍රමුඛ පදඃ*** *ප්‍රාදේශීය සංවර්ධනය, සංවර්ධන විෂමතාවය, කයි වර්ග පරීක්ෂාව*